ලංකාදීප

විමංසා සාහිත්‍ය සංග්‍රහය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා මහතා සම්පාදනය කළ 'නිදහසින් පසු සිංහල භාෂාවේ මඟ සලකුණු 1948-2023' සහ 'සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය (නව සංස්කරණය)' යන කෘති ද්විත්වය එළිදැක්වීමේ උළෙල මෙම මස 20 වැනිදා (අද) පස්වරු 3.00ට කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේදී පැවැත්වේ.

සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක මහතා මෙම උළෙලේ මුලසුන දරයි. කරුණාරත්න පරණවිතාන සහ සමුද්‍ර වෙත්තසිංහ කෙටි දෙසුම් පවත්වති. ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය ද හෙටට (21) යෙදේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා මහතා සමග මෙම සාකච්ඡාව පැවැත්වෙන්නේ එම කරුණු පදනම් කොටගෙනය

මවුබස නොදන්නා අනාගත පරපුරක් කුමටද ?

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

සඳගෝමී කෝපරහේවා

● 'සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය' කෘතියේ නව සංස්කරණය ලෙස පළවන්නේ එහි 19 වැනි මුද්‍රණයයි. ඔබ මේ නව සංස්කරණයේදී ඇති කළ වෙනස්කම් කෙබඳු ද?

"සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය මුලින්ම පළ වුණේ මීට අවුරුදු 24කට පෙර 2000 වසරේ. මගේ අරමුණ වුණේ සිංහල භාෂාව භාවිත කරන ආධුනික ලේඛකයන්ට, මාධ්‍යවේදීන්ට පදයක නිවැරැදි අක්ෂර වින්‍යාසය පහසුවෙන් සොයා ගැනීමට සුදුසු අත්පොතක් සකස් කිරීමයි. එසේම භාෂාව භාවිත කරන්නන් නිතර වරදවා යොදන වදන් අකාරාදි පිළිවෙළින් පෙළගස්වා ඒවායේ විකල්ප රූපවලට ඉඩ දී අක්ෂර වින්‍යාසය තුළ වැඩි දෙනකුට පිළිගත හැකි පොදු සම්මතයක් ගොඩනගා ගැනීමයි. මුලින් කුඩා ප්‍රමාණයේ කෘතියක් ලෙස පළ වුණත් ගත වූ වසර 24 තුළ මේ කෘතියට ලැබුණු ප්‍රතිචාර මා දිරිගන්වන සුළු වුණා. මා අපේක්ෂා කළ පාඨක සමාජයටත් වඩා පාසල් දරුවන්, ගුරුවරුන්, රාජ්‍ය සේවය, දැන්වීම් ප්‍රචාරණ අංශ අතරෙහි පවා මේ කෘතිය සම්බන්ධ උනන්දුවක් ඇති වූ බව පෙනුණා.

මෙම කෘතියේ පළ වූ මුද්‍රණ 19 තුළ සංස්කරණ පහක් සිදු කෙරුණා. එම සංස්කරණවලදී ඇතැම් අලුත් වචන එකතු කරන්නට සිදු වුණා. විශේෂයෙන්ම නිතර වරදවා යෙදෙන පොදු ව්‍යවහාර සහිත වචන පවා පසුව මීට ඇතුළත් කෙරුණා.

භාෂාව වැඩි දෙනකු අතරට යාම සඳහා භාෂා අත්පොත් ජනප්‍රිය කරවීම අවශ්‍යයි. මේ නව සංස්කරණයේදීත් පෙර ඇතුළත් නොවූ වචන රාශියක් එක්කොට තිබෙනවා. කාලීනව සමාජයේ යෙදෙන 'ණය ප්‍රතිව්‍යුහගතකරණය, කෘත්‍රිම බුද්ධිය, දක්ෂිණ අධිවේගී මාර්ගය, නිරෝධායන මධ්‍යස්ථාන' වැනි වදන් රැසක් මීට අලුතින් එකතු වුණේ ඒ අනුවයි."

ඉංග්‍රීසි බැරිවුණේ සිංහලය රාජ්‍ය භාෂාව කළ නිසා නොවෙයි

● ගත වූ 75 වසර තුළ සිංහල භාෂාවේ වර්ධනය, වෙනස්වීම් සහ අභියෝග සාකච්ඡාවට ගැනීම 'නිදහසින් පසු සිංහල භාෂාවේ මඟ සලකුණු 1948-2023' කෘතියේ අරමුණ බව පෙනෙනවා. මෙහිදී ඔබේ අවධානයට ලක්වූ කරුණු කාරණා කෙබඳු ද?

"1948 දී ශ්‍රී ලංකාව දේශපාලනික වශයෙන් නිදහස ලබාගැනීමෙන් පසුව ගෙවුණු හැත්තෑපස් වසරක (1948-2023) කාල පරිච්ඡේදයේදී සිංහල භාෂා විෂයක සිදුවීම් සමාජ වාග් විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීමයි මේ කෘතියේ අරමුණ වුණේ.

මේ කාලය තුළ සිංහලය රාජ්‍ය භාෂාවක තත්ත්වයට පත්වීම පමණක් නොව සිංහල භාෂාවේ ව්‍යාකරණය, ව්‍යවහාරය හා වාග් කෝෂය වැනි අංශවල සිදු වූ බොහෝ වෙනස්කම් මේ කාලය තුළදී දැකිය හැකියි. සිංහල ලේඛන කලාව බහුතර පිරිසක් අතර ප්‍රචාරයට පත්වීම නිසා පුරාණ භාෂා රීති වෙනුවට නව භාෂා ව්‍යවහාර එකතු වුණා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිංහල ඉගැන්වීම හා පර්යේෂණ කටයුතුවල ව්‍යාප්තිය නිසා එම ක්ෂේත්‍රයේ නිම්වළලු පුළුල් වීමක් සිදු වුණා. සිංහල භාෂාව සම්බන්ධ පොත පත බිහි වීමත් මතවාද හා වාද විවාද ඇති වීමත් රාජ්‍ය භාෂාවක් වශයෙන් පමණක් නොව කාලීන අවශ්‍යතා සපුරාලන නූතන භාෂාවක් ලෙස සිංහල භාෂාව සැලසුම් කිරීම පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් උනන්දුවක් ඇති වීමත් පසුගිය 75 වසරක කාලයේ කැපී පෙනෙනවා. ඒ නිසා මෙම කාලය සිංහල භාෂා සැලසුම්කරණය පිළිබඳ වකවානුවක් ලෙස සැලකිය හැකියි. ඒ අනුව නිදහසෙන් පසු විවිධ අවශ්‍යතා අනුව සිංහල භාෂා සැලසුම් කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර ගණනාවක සිදු වූ කටයුතු පිළිබඳ සමාලෝචනයක් මෙහිදී සිදු කෙරෙනවා. මෙම කෘතිය සම්පාදනයට පසුබිම් වුණේ 75 වැනි නිදහස් සමරුව හා ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය නිමිත්තෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේදී අප විසින් පවත්වන ලද දේශනයක්."

● 1956 දී බණ්ඩාරනායක මහතා විසින් සිංහලය රාජ්‍ය භාෂාව බවට පත් කරනු ලැබීමත්, ඊට බලපෑ සමාජ - සංස්කෘතික - දේශපාලන පසුබිමත් ඔබ මේ කෘතියේ සාකච්ඡාවට ලක් කරනවා. එහෙත් සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා සිංහලත් බැරි ඉංග්‍රීසිත් බැරි පරම්පරාවක් මෙරට බිහි වූ බවට ඇතැම් උගතුන් චෝදනා කරනවා. මේ ගැන ඔබේ මතය කුමක් ද?

"1956 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව නොකළා නම් සිදුවන්නේ කුමක් ද? එය නූතන භාෂාවක් ලෙස වර්ධනය වී සකස් වුණේත් රජයේ කටයුතුවලට, අධ්‍යාපන කටයුතුවලට සීමා වූ ඉංග්‍රීසි භාෂාව වෙනුවට මේ රටේ ග්‍රාමීයව ජීවත් වූ ස්වභාෂා උගත් පිරිසකට සමාජ වරප්‍රසාදයක් ලබන්න පුළුවන් වුණේත් සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසයි. මගේ අදහස නම් 1956 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීම තමයි මේ රටේ ඇති වූ විශාලම සමාජ වෙනස, පරිවර්තනය ලෙස සැලකිය හැක්කේ. එය දේශපාලනිකව ඇති වූ සමාජ පරිවර්තනයකට වඩා භාෂාව නිසා ඇති වුණු සමාජ පරිවර්තනයක්.

අද වන විටත් ඉංග්‍රීසි භාෂාව වැඩි දෙනකු අතරට පත්වෙලා නැහැ. දශක ගණනක් ඉංග්‍රීසි යටත් විජිතයක් ලෙස මෙරට පැවැතියත් ඉංග්‍රීසි භාෂාව සමීප වුණේ සීමිත පිරිසකට පමණයි. ඒ නිසා සිංහලය රාජ්‍ය භාෂාව කිරීමෙන් ඉංග්‍රීසි බැරි වුණාය කියන අදහස පිළිගත නොහැකි එකක්. ඉංග්‍රීසි බැරි වුණේ දෙවැනි බසක් හැටියට ඉංග්‍රීසි ඉගැන්වීම පාසල් පද්ධතිය තුළ සාර්ථකව සිදු නොවීම නිසයි. දෙවැනි බසක් හැටියට ඉංග්‍රීසි ඉගැන්වීම සහ සිංහලය රාජ්‍ය භාෂාව කිරීම කියන්නෙ කාරණා දෙකක්.

අනෙක් අතින් ඉංග්‍රීසිය දිගටම රාජ්‍ය භාෂාව හැටියට තිබුණා නම් මේ රටේ මවු භාෂාව ඉගෙනගෙන එයින් සමාජීය වශයෙන් උසස් තත්ත්වයකට පැමිණ වරප්‍රසාද ලැබූ පිරිසක් බිහි වෙන්නේ නෑ. එහෙම වුණා නම් මාර්ටින් වික්‍රමසිංහ මතු කළ බමුණු කුලයක් තමයි තවමත් මේ රටේ සියලු වරප්‍රසාද භුක්ති විඳින්නේ. බමුණු කුලයේ බිඳ වැටීම හැටියට වික්‍රමසිංහ මහතා පෙන්වා දුන්නේ ඉංග්‍රීසි භාෂාව උගත් ප්‍රභූ පිරිසකට තිබුණ අවස්ථාව මේ රටේ පොදු ජනතාවට ලැබීම පිළිබඳ කාරණයයි.

එම නිසා ඉංග්‍රීසි බැරි පරම්පරාවක් බිහි වුණා නම් බිහි වුණේ ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමවේදයේ ගැටලු පදනම් කරගෙන මිස සිංහලය රාජ්‍ය භාෂාව කිරීම නිසා නොවෙයි. කවුරු හෝ එබඳු චෝදනාවක් කරනවා නම් ඒක ජනප්‍රිය දේශපාලන මතයක් පමණයි."

● එහෙනම් රටක මාතෘ භාෂාවක් එරටෙහි සමාජ - දේශපාලන - සංස්කෘතික වශයෙන් කරන බලපෑම කෙබඳු ද?

"පෙබරවාරි මස 21 වැනි දින ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය ලෙස යුනෙස්කෝව නම් කොට තිබෙනවා. අද යුනෙස්කෝව පවා පිළිගෙන තිබෙනවා මවු බසට ලැබිය යුතු තැන පිළිබඳව. භාෂාවේ බලය රැඳී තිබෙන්නේ තමන්ගේ මවු බස තුළයි. කෙනකුගේ තාර්කික හැකියාව, කල්පනා ශක්තිය, නිර්මාණාත්මක හැකියාව සහ පුද්ගලයකුගේ භාෂාත්මක අනන්‍යතාව රැඳී තිබෙන්නේ ඒ පුද්ගලයාගේ මවු බස තුළයි. අද ලෝකයේ භාෂා අතර පවත්නා තරගය හේතුවෙන් එක් එක් ජාතීන්ගේ මවු භාෂාවලට ඇති තැන අහිමි වෙමින් තිබෙනවා.

අද අප ජීවත්වන්නේ බහු භාෂක සමාජයක. එහිදී විවිධ භාෂාවලට යම් යම් අගයන් ලැබී තිබෙනවා. ව්‍යාපාරික වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් අද ලංකාවේ මේ තැන ලැබිලා තියෙන්නෙ ඉංග්‍රීසි භාෂාවට. එවිට තමන්ගෙ මවු භාෂාවට යම් යම් බලපෑම් ඇති වෙනවා. රටක මවු බසත් සමග බැඳුණු පරිසරය ආරක්ෂා කිරීම වගකීමක්. එය තමන්ගේ මානව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාවක්. ඒ ජන කණ්ඩායමේ පවත්නා අනන්‍යතාව ප්‍රකාශ වන්නේ මවු බසින්."

● ඒත්, මවු බසින් කටයුතු කිරීමෙන් ලෝකය දිනාගත නොහැකිය යන මතයක් අද වන විට අපේ රටේ ඇති වෙමින් තිබෙනවා. මවු බස තම ප්‍රධාන සන්නිවේදන මාධ්‍යය ලෙස යොදාගෙන ලෝකය දිනාගත් දියුණු රටවල් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරාකාර ද?

"අද බොහෝ දෙනා වැරැදි මතයක සිටිනවා සියලුම ප්‍රශ්න ඉංග්‍රීසි භාෂාවෙන් විසඳන්න පුළුවන් කියලා. ලෝකයේ දැනුම ලැබීමටත් ඉංග්‍රීසි හා බැඳුණු කටයුතු සඳහාත් ඉංග්‍රීසි භාෂාව වැදගත් බව ඇත්ත. ඒත් දේශීය වශයෙන් තමන්ගෙ මවු බස පිළිබඳ දැනුමත් එක්ක ඉංග්‍රීසි භාෂාවෙන් තොරව බොහෝ රටවල් තමන්ගෙ ආර්ථිකය දියුණු කරගෙන තිබෙනවා. චීනය, කොරියාව, ජපානය ඊට හොඳම උදහරණ. ඔවුන් තම මවු බස දියුණු කිරීම ප්‍රධාන කාරණයක් ලෙස සලකා ක්‍රියා කළා. බස නගා රට හැදීමක් තමයි ඔවුන් කළේ. අපි හිතනවා රැකියාවක් ලබාගන්න නම් ඉංග්‍රීසි භාෂාව අවශ්‍යයි කියලා. හැබැයි අපේ රටේ ස්වභාෂාව දියුණු වෙලා තියෙනවා නම් ඔය ප්‍රශ්නෙ මතු වෙන්නේ නෑ. මැලේසියාව වැනි රටවල් පවා තමන්ගෙ මවු බස පදනම් කරගෙන සංවර්ධන ඉලක්කය සපුරාගන්නට මහන්සි වෙනවා. රටක සංවර්ධනය සහ භාෂාව අතර විශාල සම්බන්ධයක් තිබෙනවා.

ඒත් අපේ රටේ සංවර්ධනය ගැන කතා කරන හැම වෙලාවකම මතු කරන්නෙ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රශ්නයයි. එද ඉඳලාම මේ ප්‍රශ්නය කතා කර කර ඉන්න කාලය ස්වභාෂාව පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනගා ගන්න යෙදෙව්වා නම් අද අපි අත් විඳින ආර්ථික අර්බුදය මතු නොවෙන්න තිබුණා."

ජාත්‍යන්තර මාතෘ භාෂා දිනය හෙට

● ජාත්‍යන්තර මාතෘ භාෂා දිනයක් ගැන ලෝකය කතා කළත් ශ්‍රී ලංකාව මේ වන විට ඉංග්‍රීසියෙන් ඉගැන්වීම ගැන කතා කරනවා. මේ තත්ත්වය ඔබ දකින්නේ කෙසේ ද?

"අද වන විට විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතනවල වැඩි අවධානයක් යොමු වෙලා තියෙන්නෙ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ගැන. ඉංග්‍රීසිය ඉගැන්වීම අවශ්‍යයි. ඒත් ඒක වෙනම කාරණයක්. කුමාරතුංග මුනිදාස මහතා පවා කිව්වා 'ඉංගිරිසිය බෝ කළ යුතුයි' කියලා. ඒක වැරැදියට තේරුම් ගන්න නරකයි. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමත් ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීමත් දෙකක්.

දෙවැනි බසක් හැටියට පාසල්වල ඉංග්‍රීසි ඉගැන්විය යුතුයි. ඒත් ඒක හරියට වෙන්නෙ නෑ. ඉංග්‍රීසියෙන් හැම විෂයයක්ම ඉගැන්විය යුතුය යන පෙළඹවීම ඇති වුණේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඇති කළ ඇතැම් ජාත්‍යන්තර පාසල් නිසයි. මේවා ඒ නමින් හැඳින්වූවාට ඒ පාසල්වල ජාත්‍යන්තර ශිෂ්‍යයෝ නැහැ. ඒවායේ ඉන්නෙ මේ රටේ දරුවන්. මේ රටේම ඉපදුණු තමන්ගෙ රටේ මවු බසවත් නොදත් තමන්ගෙම භාෂාවෙන් තම දැනුම ප්‍රකාශ කරගන්න බැරි උගත් පරපුරක් මේ රටේ නිර්මාණය කරමින් සිටිනවා.එබඳු අනාගත පරපුරක් කුමටද?

ආර්ථික විද්‍යාව සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් උපාධියට ඉගෙනගත් දරුවකුට රටේ ආර්ථිකය පිළිබඳ තමන්ගෙ රටේ භාෂාවෙන් පැහැදිලි කිරීමක් කරන්න බැරි නම් වැඩක් තියෙනවා ද? මෙහෙම ගියොත් කටවහරට පමණක් සිංහල භාෂාව සීමා වෙයි. මේ නිසා ඇති වන භයානක තත්ත්වය තමයි අනාගතයේදී, මේ රටේ තීරණ ගන්නා ක්‍රියාකලාපයේදී ඉංග්‍රීසි පමණක් දන්නා සිය බසින් තමන්ගේ දැනුම ප්‍රකාශ කරගත නොහැකි පිරිසක් බිහි වීම. උසස් අදහසක් සිංහලයෙන් ප්‍රකාශ කළ නොහැකි පරපුරක් දැන් නිර්මාණය වෙමින් සිටිනවා.

අනෙක් පැත්තෙන් එහෙම වුණාම සිංහල භාෂාවේ වර්ධනය ඇනහිටිනවා. වාක්කෝෂය පුළුල් වෙන්නෙ නෑ. ස්වභාෂාවේ අගය නොදන්නා අනාගත පරපුරක් බිහි වෙමින් සිටීම බරපතළ කාරණයක්."

සංවාද සටහන

ගාමිණී කන්දේපොළ